මෙහෙම හැදෙනු

කවීන්. කී. නිලන්තපෝල

ප්‍රථම මුද්‍රණය - 2025
කතාව - සජීව ඩී. තිලකරත්න
චිත්‍ර - නුවණි තිලකරත්න
පරිගණක පිටු සැකැස්ම - දසුනි තිලකරත්න
ISBN - 978-624-208-698-9

පිදුම

මෙම නිර්මාණය එළිදැක්වීමට මා ධෛර්යයමත් කල 5-E පන්තියේ පුංචි මහමායාවියන්ටත්, මාගේ දයාබර බිරිඳටත්, දියණියන් දෙපළටත් මේ පොත ආදරයෙන් පුදමි.

පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැලපෙන බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වූ භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ. ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි. ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරාහා සිදුකිරීම වඩත් ඵලදායි වෙයි.

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම, පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි.

මෙවර අප පාසලේ ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරයගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මන හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් වීම ප්‍රශංසනීය කරුණකි. ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතුකිරීමක් බව මගේ හැඟීමයි.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක කාලයක පිටිසර ගමක ජීවත් උනා ලස්සන පවුලක්. ඒ පවුලෙ හිටියේ අම්මයි තාත්තයි පුතෙකුයි දුවෙකුයි. එයාලගේ ආච්චියි සීයයි ජීවත් උනෙත් ඒ ගෙදරමයි. ඉතින් මේ අය ඉතාම සතුටින් ජීවත් වුණා.

පුතාගේ නම කසුන් දුවගෙ නම මලිති. කසුන් හිටියෙ හතරේ පන්තියේ,මලිති තුනේ පන්තියේ. දෙන්නම ගමේ ඉස්කෝලෙට තමයි ගියේ. එයාලගේ තාත්තා රස්සාවක් කළා. අම්මා ගෙදර වැඩ කරගෙන හිටියා. ආච්චී සීයයි වත්තෙ පිටියෙ ගොවිතැන් කටයුතු කරගෙන හිටියා. ඉතින් කසුන්, මලිති ඉගෙනගන්න දක්ෂයි. ඒත් මලිති ටිකක් දගයි

"නංගී එන්නකෝ, සීයට උදව් කරන්න". සීයා වත්තේ හිටවලා තිබුණ බටු පැළවලට වතුර දාන ගමන් හිටියේ.

"මට බැහැ. මට කම්මැලියි."නංගී කීවා. "එහෙම කියන්න එපා කම්මැලිකම යන්නත් එක්ක එන්න උදව් කරන්න".

කම්මැලිකමින් ආපු නංගි අයියත් එක්ක සීයට උදව් කළා.

දැන් කම්මැලි නෑ. "මගේ හොඳ නංගි" කසුන් සීයට ඇහෙන්න කීවා.

"මගේ පුතාලා ඕනේ වැඩකට කම්මැලි වෙන්න එපා. කම්මැලි උනොත් අපි පරාදයි. අනාගතය ජයගන්න නම් කම්මැලි නොවී වැඩ කරන්න ඕනා". සීයා අප දිරි ගන්වමින් කීවා.

කසුන් ඉස්කෝලේ වැඩ වලටත් හරි දක්ෂයි. කම්මැලි නැතිව උනන්දුවෙන් වැඩ කරනවා. ඉස්කෝලේ ගුරුවරුන් කසුන්ට හරි කැමතියි. කසුන්ගේ හොඳ ගැන නිතරම කතා වුණා. කසුන්ට ඒක හරි ආඩම්බරයක් වුණා. නමුත් කසුන් ආඩම්බරකම් පෙන්නන්න ගියේ නැහැ. කසුන් හරිම නිහතමානි.

ඔන්න කසුන්ගෙ උපන් දිනය උදා වුණා". අයියේ උපන්දිනයට මොනාද කරන්නේ, අම්මගෙනුයි තාත්තගෙනුයි අහලා බලමු. එයාල කියන දෙයක්නේ අපි කරන්නේ. නේද නංගි."ඔව් ඔව් එහෙම කරමු."

අම්මේ අයියගේ උපන්දිනය ලගයි."ඔව් පුතේ, මං මතක් කරගෙන හිටියේ."

"අපි එදාට හවසට පන්සල් යමු නේද?"

"ඒක හොඳයි අම්මේ එදා ඉස්කෝලේ දවසක්නේ"

"මං මොනාහරි හදලා දෙන්නම් ඔයාගේ යාළුවොන්ටයි ,ටීචර්ටයි ගිහින් දෙන්න."

"හොදයි අම්මේ..." කසුන් කීවා

"අයියේ එන්න අම්මා කතා කරනවා."

"එනවා නංගි.."

"ඇයි අම්මේ...."

"ඔයාගේ උපන්දිනේට මම ලැවරිය හදලා දෙන්නම්. යාලුවොන්ටයි ටීචර්ටයි දීලා කන්න."

"හා අම්මේ....."

උපන්දිනයට කෑම හදන්න අම්මාට තාත්තාත් උදව් වුණා. උපන්දිනය දවසේ උදේම නැගිටලා තාත්තටයි අම්මටයි සීයටයි ආච්චිටයි වැන්දා. උදේම අම්මා හදලා දීපු ලැවරිය සීයටයි ආච්චිටයි ගිහින් දුන්නා. එයාල ඒවා සතුටින් ගත්තා. මගේ පුතාට සුභ උපන්දිනයක් වේවා කියලා ඔළුව අතගෑවා. මට හරි සතුටුයි.

එදා ඉස්කෝලේ දී මගේ යාළුවෝ මට සුබ පැතුවා.

"ඔයා මොනවද ගෙනාවෙ" තරිඳු මගේ ළගට ඇවිත් ඇහුවා.

"ලැවරිය" මම කීවා.

"හරි මම කැමතිම කෑම"

ටික වෙලාවක් ගියා. තාම පාසල පටන් ගත්තේ නෑ.

"මේ කසුන් අපි ලැවරිය කමුද?" තරිඳු ඇහුවා.

"බෑ.. බෑ.. ඉන්න ඉස්සෙල්ලාම අපේ ටීචර්ට දීලම කමු."

"ඉස්කෝලෙදි අපේ අම්මා ටීචර්නේ තරිඳු" කසුන් කීවා.

"ඇත්තමයි මට අමතක වුණා. එහෙම කරමු. ඔන්න බෙල් එක ගහනවා දැන් ටීචර් එයි."

"ටීචර් අද කසුන්ගේ උපන්දිනය.."

"ඔව් ඔව් මට මතකයි.. අපි ඔක්කොම කසුන්ට සුබ පතමු."

සියලුම දෙනා කසුන්ට සුබ පැතුවා.

"ටීචර් මම කෑමක් ගෙනාවා අම්මයි තාත්තයි හදලා දුන්නේ..."

"එහෙමද කසුන් එහෙනම් අපි ඒක විවේක කාලයේදී බෙදාගෙන කමු."

"හොඳයි ටීචර්..." අපි පාඩම් වැඩ කළා.

විවේක කාලය උදා වුනා මුලින්ම මම ටීචර්ට අම්මා ඔතලා දුන්න පාර්සලය දුන්නා.

"ටීචර් මේ ලැවරිය පාර්සලය අම්මා දෙන්න කීවා.."

"බොහෝම ස්තූතියි පුතේ.....අනිත් ටීචර්ල එක බෙදාගෙන කන්නම්කෝ."

ඊට පස්සේ මම අනිත් යාලුවන්ට ලැවරිය බෙදුවා. සමහර අය මට චූටි තෑග්ගක් දුන්නා.. මට හරි සතුටු දවසක්. අපි ඉතාම සතුටින් පාසලේ වැඩ කළා. එදා හවස පන්සල් ගිහින් බුදුන් වැන්දා. උපන්දිනය දා ගොඩක් සතුටු වුණා.

"නංගි එන්න පාඩම් කරන්න. දැන්නම් මට ශිෂ්‍යත්ව විභාගෙත් ලගයි." කසුන් ඒ අතර නංගිටත් පාඩම් කියලා දුන්නා..

දුවේ අයියත් එක්ක එකතු වෙලා ගනන් හදන්න ඕනෑ." අම්මා අපිට ඇහෙන්න කීවා.

"මට කම්මැලියි අම්මේ...." නංගි වේගයෙන් කීවා.

"හා...හා....නංගි, අම්මාට ඔහොම කතා කරන්න එපා පවුනේ. අම්මයි තාත්තයි අපි වෙනුවෙන් කොච්චර මහන්සි වෙනවාද? අපි එහෙම කතා කරනකොට එයාලට දුක හිතෙනවා. එතකොට අපිට පවු සිදු වෙනවා. එයාලගේ හිත රිදවන්න හොඳ නැහැ.." නංගි දුකින් මා දිහා බලාගෙන හිටියා. නංගි තාම පොඩියිනේ. මටත් දුක හිතුනා.

දැන් කසුන්ගේ විභාගෙත් ළඟයි. යාළුවෝ, ගුරුවරු, දෙමව්පියෝ ඔක්කොම විභාගයට සූදානම් වෙනවා. ගුරුවරු උගන්වනවා, දෙමව්පියෝ අපේ අවශ්‍යතා හොයලා බලනවා, යාළුවෝ පාඩම් කරනවා. එකම ජරමරයයි !

දවසක් අපේ ටීචර් පන්තියේ පාඩමක් කළා. ටීචර් ඉතින් ඒ පාඩම අපට තේරෙන ආකාරයට කියලා දෙන්න ගොඩාක් මහන්සි වෙනවා. අපෙන් ප්‍රශ්න අහනවා, රූප සටහන් පෙන්වනවා, ගණන් හදනවා. වැඩ ගොඩයි. ඒත් ඉතින් සමහර යාළුවෝ එයාලගේ වැඩ. ශබ්දයෙන්

කතාව. ටීචර් මේවා දැකලා තරහ ගිහින් අපිට හොඳටම බැන්නා. මටත් දුකයි ටීචර් ගැන. මම ගෙදර ඇවිත් සීයටයි ආච්චිටයි මේ ගැන කීවා. "එහෙම කරන්න එපා පුතේ, ටීචර්ලා ගොඩක් මහන්සි වෙනවා පුතාලගේ ලකුණු වැඩි කරන්න. ඒ නිසා එයාලට ඔයාලා උදව් කරන්න ඕනෑ. එතකොට තමයි ඔයාලට ජයග්‍රහණ ලැබෙන්නේ." සීයා කියාගෙන ගියා.

පසුවදා මම ඉස්කෝලේ පන්තියට ගියා. ඊයේ වෙච්චි දේ ගැන මගේ ළඟම යාළුවෙක් සමඟ කතා කළා. අපි ආයේ ටීචර්ට කීකරු ව ඉමු. යාළුවත් එක්ක කතා වුණා. යාළුවත් ඒකට කැමති වුණා. ඔව් කසුන් අපි එහෙම කරමු. පව් අපේ ටීචර්. අපේ අම්මා වගේනේ එයා. සමහර වෙලාවට අම්මටත් වැඩිය හොඳයි තරිඳු කියනවා ඇහුණා.

එදා ඉදන් අපි උගන්නන වෙලාවට ටීචර්ට උදව් කළා. නිශ්ශබ්දව පාඩමත් අහගත්තා.නොදන්න කරුණු අහලා දැන ගත්තා.දැන් ටීචර් අපිට ගොඩක් ආදරෙයි.

ශිෂ්‍යත්ව විභාග දිනය උදා වුණා.

මම උදේම අම්මට තාත්තට ආච්චිට සීයට වැදලා එන්න පිටත් වුණා.එයාලා මට 'බුදු සරණයි මගේ පුතාට' කියලා කිව්වා. මට හරි සතුටුයි. මම විභාගය හොඳින් සමත් වෙනවා කියලා හිතා ගත්තා. පාසලට ඇවිත් ගුරුවරුන්ටත් වැදලා විභාග ශාලාවේ ඉද ගත්තා. මට වැඩියෙන් අම්මා තාත්තා ගුරුවරු මතක් වුණා. මම හොඳින් විභාගය සමත් වෙලා හැමෝටම ආඩම්බරයක් ගෙන දෙනවා කියලා හිතා ගත්තා. හොඳට විභාගයට මුහුණ දුන්නා. මගෙ යාළුවෝ විභාගය ලේසියි කියලා කීවා. එදා මට හරි සතුටුයි.

'කසුන් මේ කතාවක් තියෙනවා ඔයාට කියන්න.....'

'මොකද්ද පුබුදු...'

'මේ ඊයේ අපේ අම්මා අපේ ටීචර්ට බැන්නා වගේ ඇහුණා.'

'ඇයි ඒ පුබුදු...'

'මම ගණන් හදන් නැතුව ඊයේ මට ටීචර් බැන්නා. ඒක මම අම්මට කිව්වා. ඒකට.'

'ඉතින් ඔයාගෙනෙ වැරැද්ද. ටීචර් ඔයාට බැන්නෙ ඔයා හොඳ මගට ගන්න. ගණන් හැදුවොත් කාටද හොඳ.'

'ඔව් කසුන් තේරෙනවා. මම අම්මටත් කිව්වා. අම්මාත් කිව්වා ඒකත් ඇත්ත තමයි කියලා.'

'ටීචර්ලා අපිට ගොඩක් ආදරෙයි. ඒකයි එහෙම කරන්නේ. එයාලා කැමතියි අපි හොඳ දක්ෂ කෙනෙක් වෙනවට. අපේ අම්මලාට ඉස්සර ගුරුවරු ගැහුවත් සීයා කියනවාලු, ඒක හොඳයි. ඔයාලගේ වැරදි හදන්න තමයි එහෙම කරන්නේ කියලා කියනවා මට දවසක් ඇහුණා. අපෙ නංගි කවදාවත් ටීචර් බැන්නට කියන්නෑ. මොකද අම්මා තවත් බනිනවා එතකොට. කසුන් කිව්වා.

විභාග ප්‍රතිඵල ආවා. කසුන් ඇතුළු පන්තියේ ළමයි කීපදෙනෙක්ම පාස් වෙලා තිබුණා. ගුරුවරුන්ට හරිම සතුටුයි. හැම ගුරුවරයෙක්ම පන්තියට ඇවිත් හැමෝටම සුබ පැතුවා. අපේ පන්තියේ ළමයි හැමෝම හොඳ ලකුණු අර ගෙන තිබුණා. ඉතින් අපේ දෙමාපියන්ටත් ගොඩක් සතුටුයි පුතේ ඔයාලා සියලු දෙනාටම බුදු සරණයි. අපේ සීයයි ආච්චියි

මගේ ඔළුව අතගාන ගමන් කීවා. අපේ නංගිටත් හරි සතුටුයි. මමත් අයියා වගේ විභාගේ සමත් වෙනවා. නංගි ඉතා ආඩම්බරයෙන් කීවා විභාග ප්‍රතිඵල ආවට පස්සේ පොඩි උත්සවයක් තිබුණා. ඒ උත්සවයට දෙමාපියන්,වැඩිහිටියන්,ගුරුවරු සහභාගී වුණා.ඒක තිබුණෙ අපේ ඉස්කෝලේ මිදුලේ. ඒකෙදි ගුරුවරු සතුට ප්‍රකාශ කළා. විදුහල්පතිතුමා අපට සුභාශිංසන ගෙනාවා. ගුරුවරුන්ට සුබ පැතුවා. දෙමාපියන් මතක් කොට අගනා කතාවක් කළා.

අවසානයේ දී දෙමාපිය කතාවක් තිබුණා. එහිදී ගුරුවරුන්ගේ කැපවීම ගැන වටිනා කතාවක් කළා. ඒ සියළුම කැපවීම් අපේ දරුවන් වෙනුවෙන් කළ බව කීවා. මගේ යාළුවෝ වේගයෙන් අත්පුඩි ගැහුවා. ඒ කතාව අවසානයේ අපේ අනාගතයට ගොඩක් ලොකු ශක්තියක් ලැබුණා. ටික දිනකින් විභාගය සමත් මම ඇතුළු යාළුවෝ නගරයේ ලොකු ඉස්කෝලෙකට ගියා. අපිට උදව් කළ ගුරුවරු දෙමාපියන් සියළුම දෙනාට බුදු සරණයි. මට ඉබේටම කියවුණා.

පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සුදානම් කිරීමේ වගකීම පැවැරී ඇත්තේ ගුරුවරයාටය එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශවෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය ඔවුන් සමාජයේ පෙරගමන් කරුවන් නිසා ශිෂ්‍යයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි තමා වෙත පැවැරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමග පොත් ලියන හෙරණගත්කරණී ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුනට ද ආදර්ශයකි ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්

හෙරණගත්කරණී නිර්මාතෘ

සෙනෙවිරත්න මහලේකම්

2025 02 08